**ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ**

------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

--------

ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුලි 15 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා ආදායම් සංකේතාංක 11 ක් යටතේ රු.61,750,000,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සියළුම ආදායම් සංකේතවල මූලික ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. ඉන් ආදායම් සංකේත 10 ක මුළු ආදායම් ඇස්තමේන්තු රු.12,250,000,000 කින් අඩු කර තිබුණි. 2003.05.00 භාණ්ඩාගාර බැඳුම්කර අධිහාරය මුල් ආදායම් ඇස්තමේන්තුවේ සඳහන් රු.6,200,000,000 ක ආදායම රු.7,300,000,000 කින් වැඩි කර ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි. සමස්ථයක් වශයෙන් දෙපාර්තමේන්තුව විසින් මුල් ආදායම් ඇස්තමේන්තුව අනුව රැස්කිරීමට අපේක්ෂා කර තිබූ ආදායම රු.4,950,000 කින් අඩු කර ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි.<br><br>කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආදායම් සංකේත 11 කින් රු.70,175,052,224 ක ආදායමක් රැස් කර තිබුණි. ආදායම් සංකේත 5 ක මුල් ආදායම් ඇස්තමේන්තු ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් ඇස්තමේන්තු කිරීම හා ඒවා සංශෝධනය කිරීම තාත්ත්වික පදනමක් මත සිදු කර නොතිබුණි. | 2020 ජූනි මාසයේදී එනම් රාජ්‍ය සේවයේ කටයුතු යම්තාක් දුරට සක්‍රීය වූ කාල වකවානුවකදී ආදායම් සංකේත 11 සඳහා රු.61,750,000,000 ක ඇස්තමේන්තුවක් පිළියෙල කරන ලදී. එහෙත් කොවිඩ් දෙවන රැල්ලත් සමග නැවත රාජ්‍ය සේවය අක්‍රීය වූ හෙයින් 2021 ජූලි මාසයේදී ආදායම් සංකේතයන් 10 ක් සඳහා වූ ඇස්තමේන්තුව රු.12,250,000,000 කින් අඩු කර රු.56,800,000,000 ක් ලෙස සංශෝධනය කළ අතර 2021 වර්ෂයේ අග භාගයේදී එන්නත්කරණය වැනි ක්‍රියාවලීන් තුළින් රාජ්‍ය සේවය සක්‍රීය වීම සෘජුවම බල පෑ ආදායම් සංකේත 05 ක ආදායම මුල් ආදායම් ඇස්තමේන්තුව අභිබවා රැස් කර ඇත.<br><br>වෙළඳපොල සාධකවල හැසිරීම මත රඳාපවතින ආදායම් සංකේත 20.03.05.00 ක භාණ්ඩාගාර බැඳුම්කර අධිහාරය මුල් ආදායම් ඇස්තමේන්තුවේ සඳහන් රු.6,200,000,000 ක ආදායම රු.7,300,000,000 කින් වැඩි කර රු.13,500,000,000 ලෙස ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර ඇත. | මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 වර්ෂය ආරම්භයේදී ආදායම් සංකේත 7 ක් යටතේ රු.9,896,151,815 ක හිඟහිටි ආදායම් පැවතුණු අතර ඉන් රු.8,810,689,720 ක් 2019 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබුණි. දීර්ඝ කාලයක සිට පැවත එන එම හිඟහිටි ආදායමෙන් සමාලෝචිත වර්ෂයේදී එක් සමාගමක රු.13,000,000 ක් පමණක් අය කර ගෙන තිබුණි. 2020 වර්ෂයේදී අයකර ගත යුතුව තිබුණු රු.1,085,462,095 ක ආදායමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.16,103,048 ක් අයකර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.9,896,151,815 ක හිඟහිටි ආදායමෙන් එකතුව රු.7,548,679,264 ක්, හිඟ ආදායම් කපා හැර තිබුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශය හා ධීවර අමාත්‍යාංශය විසින් පිළිවෙලින් 2021.01.11 දින හා 2020.12.04 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් ලද අනුමැතිය මත මිල්කෝ අයතනයෙන් හා ධීවර අමාත්‍යාංශයෙන් හිඟ හිටව පැවති පිළිවලින් රු.7,431,611,375 ක් හා රු. 117,067,890 ක හිඟ ආදායම් හා පොලී ආදායම් වාර්තාවෙන් ඉවත් කරන ලදි. ඒ අනුව අදාල ණය මුදල කපා හැරීම සම්බන්ධ විධිමත් පරිදි ප්‍රතිපාදන සලසාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇති අතර එයට අදාල හිඟ පොළී ආදායම් අත්හැර දැමීම සම්බන්ධව මු.රෙ.113 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇත. | හිඟ හිටි ආදායම් කාර්යක්ෂමව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | එසේ කපා හල ආදායම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් නොකර ණයලාභී ආයතන වලට රජයේ ප්‍රාග්ධන දායකත්වයට එම වටිනාකම් බැර කර තිබුණි. මේ වන විටත් ඒකාබද්ධ අරමුදලට බැර කළ ආදායමක් කපා හැරීමට විධිමත් පරිදි අනුමැතියක් ලබා ගත යුතු වූ අතර, ඒ සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලබා ගෙන ඒකාබද්ධ අරමුදලට වැය බරක් කළ යුතුව තිබුණි. 2021 මාර්තු 3 දිනැති අංක TO/REV/SL/2/288 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් ඇමතු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් එසේ කපා හරින ලද මුදල ද ඇතුළත් වන පරිදි රු.8,169,034,183 ක් රජයේ සමාගමක රජයේ ප්‍රාග්ධන දායකත්වයට එකතු කරන ලෙස දන්වා තිබුණි. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් එම ප්‍රාග්ධන දායකත්වය සඳහා පාර්ලිමේන්තුවේ | අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2021 වර්ෂයේ දී මිල්කෝ (පුද්ගලික) සමාගමෙන් අයවීමට තිබු රු.8,169,034,183.39 ක ණය මුදල රජයේ ආයෝජනයක් ලෙස සලකා ප්‍රාග්ධනිත කිරීමට හා පොලීය අත්හැර දැමීමට තීරණය කළ අතර, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට මෙම ණය මුදල ප්‍රාග්ධනිත කිරීමට දැනුම් දුන් අතර, එයට අදාළව ප්‍රතිපාදන සලසා ගැනීම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට අදාල කාර්යයකි. | ව්‍යවස්ථාපිත ආයතනයකට ප්‍රාග්ධන දායකත්වය සඳහා ඒකාබද්ධ අරමුදලෙන් ප්‍රතිපාදන ලබා දීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදන ලබා ගැනීමකින් තොරව රජයේ ප්‍රාග්ධන දායකත්වයට බැර කර තිබුණි. | | |
| **(ඇ)** | සමාලෝචිත වර්ෂයට අදාළව රැස් කර ගත යුතුව පැවති ආදායමෙන් රු.54,923,038 ක් වර්ෂය අවසාන වන විට හිඟහිටව පැවතුණි. ඒ අනුව 2022 අප්‍රේල් 30 දින වන විට ඉන් රු.25,175,535 ක් අයකර ගෙන තිබුණි. ඉන් 2019 හා ඊට පෙර සිට පැවත එන රු.2,348,117,006 ක හිඟහිටි ආදායමක් 2022 අප්‍රේල් 30 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | 2021.12.31 වන විට හිඟව ඇති රු.2,373,292,541 ක හිඟ ආදායමෙන් 2022.04.30 දින වනවිට රු.25,175,535 ක් අයකර ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | හිඟ හිටි ආදායම් කාර්යක්ෂමව රැස්කළ යුතු වීම. |

**2.2** **වියදම් කළමනාකරණය**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයක් හා මූලධන වැය විෂයයන් තුනක් සඳහා සලසා තිබුණු එකතුව රු.400,450,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | මෙම ඉතිරි කිරීම්වලට අදාළ හේතූන් මූල්‍ය ප්‍රකාශනයේ ACA 2(ii) මඟින් ඉදිරිපත් කර ඇත. | මු.රෙ.50 ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මඟින් රු.2,000,000,000 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන් කිසිදු උපයෝජනයක් නොකර ඉතිරි කර තිබුණි. | පොලී මුදල නිශ්චිතව පුරෝකථනය කිරීම ඉතා අපහසු කාර්යයක් වන බැවින් වෙළඳපොළ තත්ත්වයන් යටතේ නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත් මත පොලී ගෙවීමට සිදුවේ යැයි අපේක්ෂාවෙන් අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කරන ලදී. භාණ්ඩාගාර පොලී අනුපාතිකයන් නිශ්චිතව ඊට පෙර අවස්ථාවකදී පුරෝකථනය කළ නොහැකිවූ බැවින් අමතර ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | අත්‍යාවශ්‍ය හා හදිසි වියදම් සඳහා පමණක් පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් ප්‍රතිපාදන ලබා ගත යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුනරාවර්තන වැය විෂයන් 07 ක් හා මූලධන වැය විෂයන් 02 ක් සඳහා අධිප්‍රතිපාදන සැලසීම හේතුවෙන් එම ප්‍රතිපාදන වර්ෂය තුළ උපයෝජනය කළ පසු ඉතිරිය රු.237,178,550 ක් වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂයයන් වෙනුවෙන් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 81 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මෙම ඉතිරි කිරීම් වලට අදාළ හේතුන් මූල්‍ය ප්‍රකාශනයේ ACA 2(ii) මඟින් ඉදිරිපත් කර ඇති කරුණු තවදුරටත් අදාල වේ. | මු.රෙ.50 ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තු නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතුවීම. |

**2.3 තැන්පත් ශේෂයන්**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයෙහි ACA 4 ආකෘතියෙහි ඇතුළත් තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම් වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු 2021 දෙසැම්බර් 31 දිනට රු.18,969 ක ශේෂයක් පැවති අතර, ඒ සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අංක 6000-0-0-13-000 දරන තැන්පත් ගිණුම මෙම දෙපාර්තමේන්තුවට අදාළ නොවන බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | මු.රෙ. 427 ප්‍රකාරව දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර පොත් සමඟ සසඳා නිවැරදි කර ගත යුතුවීම. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම නිරීක්ෂණය විය**.**

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 2021 දෙසැම්බර් 30 දිනැති අංක SA/MAA/02/01/01 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් ගේ ලිපිය | 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය සෘණ රු.2,325,108,410,892 ක් වී තිබුණි. සංශෝධිත ACA – 7 ආකෘතියේ සඳහන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ද 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ශේෂය සෘණ රු.2,325,108,410,892 | 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන අනුව ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් වලින් මුළු වියදම අඩු කළ විට 2021.12.31 දිනට දෙපාර්තමේන්තුවේ අග්‍රිම ශේෂය සෘණ රු.2,325,108,410,892 ක් වේ. එසේම එම අග්‍රිම ශේෂය සඳහා වන හේතුන් ACA 7 ආකෘතිය මගින් දක්වා | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් ලබා දී තිබුණු උපදෙස් තාර්කිකව ඉදිරිපත් කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | ක් වී තිබුණි. නමුත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අග්‍රිම ගැලපුම් ශේෂය ධන (+) රු.2,325,108,410,892 ක් විය යුතුව තිබුණත් එය ඍණ සංඛ්‍යාවක් ලෙස දක්වා තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 0 (ශූන්‍ය) අගයක් ලෙස දැක්වීම තාර්කිකව සිදු වී නොතිබුණි. | ඇත. එහි අගයද ඍණ රු.2,325,108,410,892 වේ. | |
| **(ii)** | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශය | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්ගේ මුදල් වැය කිරීම් ලෙස භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු.6,268,445 ක් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා එම අත්පත් කර ගැනිම් රු.6,663,776 ක් වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 395,331 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම මුදල් පොතට අනුව වියදම සැලකිල්ලට ගත් විට ඔබ විසින් පෙන්වා දෙනු ලැබූ වෙනස්වීම් දක්නට නොමැති බව දන්වා සිටිමි. එසේම ඔබ විසින් වැය විෂයය අංක.249-1-1-2401 ට අදාල වියදම් සැලකිල්ලට ගෙන නොමැති අතර මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම්ද ඇතුළත් කර ඇති නිසා මෙම වෙනස ඇති වී ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු විම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**3.1.1 රාජ්‍ය ණය ගිණුම්ගත කිරිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශ ණයවලට අදාළව මුදල් ප්‍රවාහ කළමනාකරණය හා ණය ගනුදෙනු ගිණුම්ගත කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී නොතිබුණි. | විදේශ ණය උපලබ්ධීන් හා ණය ආපසු ගෙවීම් වලට අදාළව දත්ත පද්ධතිය පවත්වා ගෙන යාමේ වගකීම ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දරනු ලැබේ. එබැවින් එම දත්ත පද්ධතියේ සඳහන් තොරතුරු මුදල් ප්‍රවාහ කළමනාකරණ හා ණය ගිණුම්ගත කිරීමේ මූලාශ්‍රය ලෙස යොදාගනු ලැබේ. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ආ) | රාජ්‍ය ණය ගිණුම්ගත කිරීම සඳහා අනුගමනය කර තිබූ ගිණුම්කරණ ක්‍රමවේද/ පදනම් වරින් වර වෙනස් කිරීම හේතුවෙන් රජයේ මූල්‍ය ප්‍රකාශනවල සංගතභාවය ආරක්ෂා වී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | | |
| | (i) 2016 වර්ෂයට පෙර නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල අවමිල ගිණුම්ගත නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 318,246 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. කෙසේ වුවද, මෙම අවමිල ගිණුම්ගත කිරීම සඳහා රු. බිලියන 318 ක ප්‍රතිපාදන සළසා ගත යුතුව ඇති බවත් ප්‍රායෝගිකව එවැනි විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් සළසා ගැනීම අයවැය හිඟය ඉහළ යාමට | 2016 වර්ෂයට පෙර නිකුත් කරන ලද එහෙත් 2020.12.31 දින වන විට තවදුරටත් පරිණතවීමට තිබූ භාණ්ඩාගාර බැඳුම්කරවලට අදාළව රු.මිලියන 291,166 ක් ගිණුම් ගත කරන ලද අතර, ඒ අනුව 2020.12.31 දින වන විට ගෙවීමට ඇති සියලුම භාණ්ඩාගාර බැඳුම්කරවල මුහුණත අගය වර්තමානයේදී මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය වේ.<br><br>ඉහත පරිදී ගිණුම්ගත කරන ලද අවමිල ප්‍රමාණය, වර්ෂ 2045 දක්වා කාලය තුළ පරිණත වන අතර, එම එක් එක් වර්ෂයේදී | නිවැරදි හා විධිමත් ක්‍රමවේද / පදනම් මත මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | හේතු වන හෙයින් 2016 වර්ෂයට පෙර නිකුත් කළ බැඳුම්කරවලට අදාළ අවමිල එම බැඳුම්කර කල්පිරෙන වර්ෂයේදී ගැලපීම් කිරීමටත් එතෙක් මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් ලෙස එම බැඳුම්කරණ මුහුණත අගය හෙළිදරව් කිරීමටත් පියවර ගෙන ඇති බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට දන්වා තිබුණි. එසේ වුවද, 2020 දෙසැම්බර් 31 දිනට එසේ ප්‍රතිපාදන ලබා ගැනීමකින් තොරව එම වට්නාකම ගිණුම්ගත කර තිබුණි. | පරිණතවන විට එම බැඳුම්කරවල පොත් අගය මෙන්ම අවමිලද ආපසු ගෙවීම් කිරීම සඳහා අදාළ වර්ෂවලදී අයවැය ලේඛනයෙන් වාර්ෂිකව ප්‍රතිපාදන සලසා ගත යුතු වේ.<br><br>කෙසේවුවද 2020 වර්ෂය අවසාන වන විට ගිණුම්ගත කළ රු. මිලියන 291,166 ක් වූ අවමිල ප්‍රමාණයෙන් 2021 වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වන්නේ රු.276,939,878,174 ක අවමිල ප්‍රමාණයක් පමණි. | |
| (ii) | 2020 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල මහ බැංකු අත්තිකාරම, දේශීය ණයක් ලෙස වර්ගීකරණය කර ඊට හේතුද ඉදිරිපත් කර තිබුණි. නමුත් 2021 වර්ෂයේදී එම මහ බැංකු අත්තිකාරම් ශේෂය වූ රු.මිලියන 150.1 ක්, දේශීය ණය වර්ගීකරණයෙන් ඉවත් කර වෙනමම අයිතමයක් ලෙස දක්වා තිබුණි. | රජයේ ගිණුම පිළියෙල කිරීමේ වගකීම දරන්නේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වන අතර ඒ අනුව 2021 වර්ෂයේදී, දේශීය ණයක් ලෙස වර්ගීකරණය කර තිබූ මහ බැංකු අත්තිකාරම් ශේෂය වූ රු.මිලියන 150.1 ක්, දේශීය ණය වර්ගීකරණයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් විමසීම සුදුසු වේ. | නිවැරදි හා විධිමත් ක්‍රමවේද / පදනම් මත මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු විම. |
| (ඇ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2021 වර්ෂයේ හා 2020 වර්ෂයේ හෝ ඊට පෙර උපලබ්ධි වූ නමුත් 2021 වර්ෂය අවසන් වන විටත් ගිණුම් ගත නොකළ විදේශ ණයවල 2021 දෙසැම්බර් 31 දිනට වට්නාකම පිළිවෙලින් රු.මිලියන 16,883.6 ක් හා රු.මිලියන 21 ක් විය. කෙසේ වුවද මෙම වට්නාකම හා තථ්‍ය ගණනය කිරීම් වට්නාකම අතර වෙනසක්ද නිරීක්ෂණය විය. | | |
| (i) | සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂවලදී ද උපලබ්ධි වී ඇති නමුත් | අදාළ අමාත්‍යාංශය සතුව 2021 වර්ෂයේ ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන නොමැති වීම හා අදාළ | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්ගත නොකළ වටිනාකම් පැවති අතර එසේ ගිණුම්ගත නොකිරීමට හේතු වූ කරුණු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘති විසින් 2021.12.31 දිනට වියදම් සහතික නොකිරීම හේතුවෙන් විදේශ ණය ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබුණි. | වීම. |
| | (ii) ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් කර තිබුණු විදේශ ණය වටිනාකම නිවැරදි නොවන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ඈ) | 2021 වර්ෂයේදී ගිණුම්ගත කළ එහෙත් 2020 වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල උපලබ්ධි වූ විදේශ ණයවල වටිනාකම රු.මිලියන 5,671 ක් වී තිබුණි. ඒ අනුව අදාළ වර්ෂය තුළ උපලබ්ධි වුවත් එම වර්ෂය තුළ සමහර විදේශ ණය ගිණුම්ගත නොකිරීම දිගින් දිගටම සිදු වී තිබුණු බව අනාවරණය විය. | අදාළ අමාත්‍යාංශය සතුව 2021 වර්ෂයේ ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන නොමැති වීම හා අදාළ ව්‍යාපෘති විසින් වියදම් සහතික නොකිරීම හේතුවෙන් වර්ෂය තුළ උපලබ්ධි වූ සියළුම ණය එම වර්ෂය තුළදීම ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබුණි. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනට විදේශ ණය මූලාශ්‍රය වන CS-DRMS 2000+ Report 854-1 හා එදිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අතර ණය අංක 2001042 ට අදාළව රු.මිලියන 240 ක වෙනසක් නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ඊ) | 2021 දෙසැම්බර් 31 දිනට CS-DRMS 2000+ Report 854 – 1 හි ඇතුළත් වූ ණය ගිවිසුම් 8 කට අදාළව එකතුව රු.මිලියන 311,191 ක විදේශ ණය වටිනාකම, රජයේ මූල්‍ය ප්‍රකාශනවලින් මුළුමනින්ම ඉවත් කර තිබුණු අතර ඒ තුළ වූ හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා රජය ලබා ගෙන තිබූ රු.මිලියන 161,132 ක් 2021 දෙසැම්බර් 31 දිනට වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කර තිබුණි. | 2021.12.31 දිනට පැවති රු.මිලියන 311,190 ක මුදල එම ණය මුදල් යටතේ අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල සටහන් විය යුතු බැරකමක් වේ. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (උ) | රජය විසින් 2021 වර්ෂයේ ඇතිකර ගත් ගිවිසුම්ගත බැඳීම් යටතේ වූ ණය ගිවිසුමකට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 589 ක් වූ ණය ශේෂය, රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 854-1 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එම වටිනාකම් රාජ්‍ය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නැත. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ඌ) | CS-DRMS 2000+ Report 854 – 1 වාර්තාවේ ණය ගිවිසුම් දෙකකට අදාළව ණය ව්‍යවහාර මුදල (Loan Currency) යුරෝ (EUR) ලෙස සලකා තිබුණද රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය වි.ගැ.හි (XDR) සහ එ.ජ.ඩො. (USD) වශයෙන් සලකා තිබුණි. මේ හේතුවෙන් එකම ණය ශේෂ සඳහා වෙනස් ණය ව්‍යවහාර මුදල්වලට අදාළ විනිමය අනුපාත භාවිතා කිරීම නිසා රජයේ මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 340 ක හා රු. මිලියන 285 ක වෙනස්කම් පැවතුණි. | ප්‍රගතිය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් විමසීම සුදුසු බව දන්වා සිටිමි. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (එ) | CS-DRMS 2000+ Report 854 – 1 අනුව ණය අංක දෙකකට අදාළව එකතුව රු.12,463 ක ඍණ අගයන් පැවතුණි. එසේ ඍණ ශේෂයක් පැවතීමට බලපාන ණය මුදල් වැඩිපුර ආපසු ගෙවා නොතිබුණු බව සනාථ කෙරෙන තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළයුතු වීම. |
| (ඒ) | ණය ගිවිසුම් දෙකකට අදාළව රු.1,481,264 ක ඍණ ණය ශේෂ රජයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණු අතර එම ණය ශේෂයන් ඍණ අගයන් ගැනීමට සහ එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට හේතු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වර්ෂය අවසානයේදී වන විනිමය අලාභය ණය ගිණුමට හා වත්කම් ගිණුමට පමණක් ගලපණු ලබයි. කෙසේ නමුත් උපචිත පදනමට ගිණුම් පිළියෙල කිරීමක් සිදු නොකරන බැවින් අදාළ අලාභය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීමක් සිදුකරනු නොලැබේ. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | ණය අංක 2010107 ට අදාළව රු.233,844 ක ණය ශේෂයක් රජයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණු අතර එය ඉවත් කිරීමට හේතුව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම මුදල මහබැංකුවේ පවත්වාගෙන යනු ලබන අදාළ බැංකු ගිණුමට බැර කර ඇත්තේ 2021.09.01 දින බැවින් අදාළ වෙනස සිදුවී ඇත්තේ දින 2 කදී පැවති විනිමය අනුපාතය විචලනය හේතුවෙනි. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ඕ) | රජයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූණු සටහන් අංක 29(i) හි සඳහන් රු.මිලියන 20,247 ක ණය ශේෂය තහවුරු කර ගැනීමට අවශ්‍ය අදාළ තොරතුරු CS-DRMS 2000+ Report 854 – 1 හි ඇතුළත් වී නොතිබුණු බැවින් එම ශේෂය තහවුරු කර ගැනීමට අවශ්‍ය මූලාශ්‍ර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු සැපයිය යුතු වේ. | රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

**3.1.2 භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි නිකුත් කිරිම**

**---------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වන විට බාහිර ආයතන වෙත අවස්ථා 241 ක් යටතේ රු. මිලියන 1,813,176 ක බැංකු ඇපකර හා අවස්ථා 23ක් යටතේ රු.මිලියන 81,268 ක සහන ලිපි නිකුත් කර තිබුණි. භාණ්ඩාගාර ඇපකර කල් ඉකුත් වීම මත 2021 වර්ෂයේදී අවස්ථා 27 කට අදාළව රු.මිලියන 74,360 ක් හා එ.ජ.ඩොලර් මිලියන 1,886 ක වටිනාකමින් යුත් භාණ්ඩාගාර ඇපකර හා අවස්ථා 12 කට අදාළව රු. මිලියන 29,550 ක හා එ.ජ.ඩොලර් මිලියන 160 ක වටිනාකමකින් යුත් සහන ලිපිවලට අදාළව කාලය දීර්ඝ කර තිබුණි. 2021 හෝ ඊට පෙර වර්ෂවල ලබා දුන් සහන ලිපි වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.1,832,112,103 ක ණය වාරික හා පොළී ගෙවා තිබුණි. ඒ තුළ මිහින් ලංකා සමාගම වෙනුවෙන් නිකුත් කළ ඇපකර 06 කට අදාළ එකතුව රු.මිලියන 1,740 ක් පොළී මුදලක් හා රු.මිලියන 91 ක ණය වාරික වටිනාකමක් ඇතුළත් විය. | සමුපකාර තොග වෙළඳ සංස්ථාව මඟින් ලබාගෙන තිබූ රු.මිලියන 880 ක ඇපකර වටිනාකම සම්බන්ධව රේඛීය අමාත්‍යාංශය දැනුවත්කර සහන ලිපිවල අදාල ණය ශේෂයන් පියවීමට හෝ සහන ලිපිවල වලංගු කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව 2020.11.20 ,2021.03.18 හා 2021.11.09 දිනැති ලිපි මඟින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත.මෙතෙක් පිළිතුරු ලැබී නොමැත. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා ගතයුතු වීම. |

| | | |
|---|---|---|
| ආයතන 02 ක් වෙත නිකුත් කර තිබූ එකතුව රු.මිලියන 880 ක් වූ භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපිවලට අදාළ වලංගු කාලය, 2022 මැයි 31 දින වන විටත් දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. බැංකු ඇපකර හා ලිපි ලබා දුන් ආයතනයන්ට අදාලව සිදු කළ නියැදි ලිපිගොනු පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) **ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම වෙත නිකුත් කළ භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි** | | |
| (i) සීමාසහිත ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම වෙත 2016 වර්ෂයේ සිට ලංකා බැංකුවෙන් සහ මහජන බැංකුවෙන් වාර 8 කදී එ.ජ. ඩොලර් මිලියන 200 ක් හා රු.මිලියන 26,250 ක් වශයෙන් කෙටිකාලීන ණය හා මහජන බැංකුවෙන් එ.ජ.ඩොලර් මිලියන 5.38 ක් හා රු.බිලියන 1.352 ක් වශයෙන් ප්‍රාග්ධනීකෘත පොළී පහසුකම් යටතේ ලබාගෙන තිබූ ණය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය ඇපකර හා සහන ලිපි නිකුත් කර තිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා ගතයුතු වීම. |
| (ii) රාජ්‍ය බැංකු හරහා ලබා ගත් ඉහත ණය පහසුකම්වලට අමතරව 2024 ජුනි මාසයේදී ආපසු ගෙවිය යුතු වර්ෂ 5 ක ජාත්‍යන්තර බැඳුම්කරයක් මාර්ගයෙන් එ.ජ.ඩොලර් මිලියන 175 ක අරමුදල් සම්පාදනය කර ගැනීම පිණිස සීමාසහිත ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම සඳහා ඇප සහතිකයක් ශ්‍රී ලංකා රජය නිකුත් කර තිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා ගතයුතු වීම. |

| | | |
|---|---|---|
| (iii) 2016 වර්ෂයේ සිට ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ කාර්යසාධනය ඉතා අහිතකර තත්ත්වයක පැවති අතර, ඒ හේතුවෙන් බලාපොරොත්තු වූ පරිදි ණය මුදල් පියවීමට නොහැකි බව වාර්තා වී තිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගතයුතු වීම. |
| (iv) අංක 17/2383/733/026-1 අනුව මිහින් ලංකා ගුවන් සමාගම ඇවර කිරීම සඳහා අමාත්‍ය / මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි. නමුත්, 2020 ජනවාරි 30 දිනැති අංක MF/PE/CM/2020/12 දරන මුදල්, අර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව, ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියක් සිදු කර තිබූ අතර එම ආයතනය (NAPPP-NATIONAL AGENCY FOR PUBLIC PRIVATE PARTNERSHIP) මේ වන විට ක්‍රියාත්මක නොවන බවත්, රජය විසින් ශ්‍රී ලංකා ගුවන් සමාගමේ අනාගතය පිළිබඳ තීරණයක් ගන්නා තෙක් සහන ලිපි නැවත නැවත නිකුත් කිරීමට සිදු වන බවත් දන්වා තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා ගතයුතු වීම. |
| (ආ) **මිහින් ලංකා සමාගම වෙත නිකුත් කළ භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි** | | |
| (i) 2015 ජුලි 14 දිනැති අංක PE/AV/SLA/CM/2015 දරන අමාත්‍ය මණ්ඩල සටහනින් මිහින් ලංකා ගුවන් සේවාවේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා ලංකා බැංකුවෙන් රු.මිලියන 1,650 ක කෙටිකාලීන ණය පහසුකම් ලබා දී තිබූ අතර, | භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත මෙම සහන ලිපියේ වලංගු කාලය 2022.12.31 දක්වා දීර්ඝ කරන ලදි. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| | මෙම ණය මුදල ගෙවිය යුතු කාලසීමාව 2016 මාර්තු 31 දිනෙන් කල් ඉකුත් වී තිබුණි. නමුත් ණය මුදල ආපසු ගෙවීමේ කාලසීමාව දිගින් දිගටම දීර්ඝ කරමින් සහන ලිපි නිකුත් කර තිබුණි. කෙසේ වුවද අවසන් දින දීර්ඝ කිරීම, 2022 දෙසැම්බර් 31 දින දක්වා හෝ අයකිරීමේ කටයුතු අවසන් වන තෙක් යන කවර හෝ කලින් එළඹෙන දිනය දක්වා ලබා ගෙන තිබුණි. | | |
| (ii) | මිහින් ලංකා පුද්ගලික සමාගම විසින් මහජන බැංකුවෙන් ලබා ගත් ණය මුදල් වෙනුවෙන් 2020 දෙසැම්බර් 21 දින දක්වා ගෙවිය යුතු පොළිය හා ප්‍රාග්ධන මුදලේ කොටසක් ලෙස රු.මිලියන 1,000 ක්, මහජන බැංකුවෙන් භාණ්ඩාගාරය වෙත 2021 වර්ෂයට අදාළව ලැබිය යුතු රු.මිලියන 1,000 ක ලාභාංශයක් වෙනුවෙන් හිලව් කරමින් නිරවුල් කිරීමට කටයුතු කර තිබුණි. එම ණය මුදල වෙනුවෙන් 2020 දෙසැම්බර් 21 දින දක්වා ගෙවිය යුතු පොළිය ලෙස රු.මිලියන 831.4 ක් ගෙවා තිබුණි. | මිහින් ලංකා පුද්ගලික සමාගම විසින් මහජන බැංකුවෙන් ලබාගත් ණය මුදල් වෙනුවෙන් 2020.12.21 දින දක්වා ගෙවිය යුතු පොළිය හා ප්‍රාග්ධන මුදලේ කොටසක් ලෙස රු.මිලියන 1000 ක මුදල, මහජන බැංකුවෙන් භාණ්ඩාගාරය වෙත 2021 වර්ෂයට අදාළව ලැබිය යුතු රු.මිලියන 1000 ක ලාභාංශයක් වෙනුවෙන් හිලව් කරමින් නිරවුල් කිරීමට කටයුතු කර ඇත.<br><br>එසේම මිහින් ලංකා පුද්ගලික සමාගම විසින් ලංකා බැංකුවෙන් ලබාගත් ණය මුදල වෙනුවෙන් 2020.12.21 දින දක්වා ගෙවිය යුතු පොළිය ලෙස රු.මිලියන 831.4 ක් ගෙවා ඇත. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා ගතයුතු වීම. |
| (iii) | ලංකා බැංකුවෙන් ලබා ගත් රු.මිලියන 1,650 ක ණය මුදලින් 2021 දෙසැම්බර් 31 දින වන විට රු.1,560,962,436 ක හිඟ ප්‍රාග්ධන ශේෂයක් ද රු.180,765,865 ක පොළී ශේෂයක් ද වශයෙන් එකතුව රු.1,741,728,301 ක හිඟ මුදලක්, තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි. | රු.මිලියන 1,650 ක ණය මුදලින් 2021 ඔක්තෝබර් 30 දින වන විට රු.1,560,962,436 ක හිඟ ප්‍රාග්ධන ශේෂයක්ද රු.180,765,865 ක පොළී ශේෂයක්ද වශයෙන් රු.1,741,728,301 ක හිඟ මුදලක් තවදුරටත් ගෙවිය යුතුව පවතී. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා ගතයුතු වීම. |

### 3.1.3 විදේශ ප්‍රදාන

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විදේශ ප්‍රදාන මඟින් ඉටු කරන ලබන ව්‍යාපෘති 80 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.10,704,894,161 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් ව්‍යාපෘති 76 ක් සඳහා එකතුව රු.3,416,022,632 ක අග්‍රිම නිදහස් කර තිබුණි. අග්‍රිම නිදහස් කිරීම සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 32 ක් පමණක් වී තිබුණි. | විදේශීයව ලැබෙන ප්‍රදාන මුදල් අදාළ පරමාර්ථ/අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීම සඳහා රජයේ අයවැය ලේඛනය මගින් විදේශාධාර ලබා ගන්නා එක් එක් අමාත්‍යාංශවල /දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් වෙත ප්‍රතිපාදන වෙන්කර දෙනු ලැබේ. විදේශ ප්‍රදාන වලට අදාළව ලැබෙන මූල්‍යමය සම්පත් වාර්තාගත කර පවත්වාගෙන යාම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන්ගේ ඉල්ලීම මත, සලසා ඇති අයවැය ප්‍රතිපාදන යටතේ වරින් වර අක්මුදල් එම ආයතන වෙත නිදහස් කරනු ලැබේ. | ප්‍රදායකයින්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාළ අරමුණුවලට යෙදවීම පිළිබඳව සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කළ යුතු වීම. |
| (ආ) 2021 වර්ෂයේදී ප්‍රදායකයන් 33 දෙනෙකු විසින් අවස්ථා 137 ක් යටතේ රු.2,483,653,900 ක විදේශ ප්‍රදාන ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.45,620,543 ක් නැවත ප්‍රදානකරු වෙත ආපසු හරවා යවා තිබුණි. | 2021 වර්ෂය තුළදී විදේශ ප්‍රදාන ලෙස මුදලින් රු.2,483,653,900 පමණක් ලැබී ඇත. එසේම වර්ෂය අවසාන වන විට රු.45,620,543 ක් පමණක් ආපසු ප්‍රදානකරු වෙත යවා ඇත. අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරියාගේ සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත පමණක් එම මුදල් ප්‍රදානකරු වෙත ආපසු යැවීමට මෙම දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ඇත. | ලැබුණු විදේශ ප්‍රදාන උපරිම ලෙස උපයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් පරිසර අමාත්‍යාංශය වෙත උතුරු මැද පළාතේ Recycling Used Agrochemical Containers ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ ලබා දී තිබූ රු.1,759,670 ක විදේශ ප්‍රදාන නැවත ප්‍රදායක වෙත හරවා යවා තිබුණි. | ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පරිසර අමාත්‍යාංශයේ ව්‍යාපෘතියක් සඳහා 2020 වර්ෂයේ අවසාන භාගයේදී රු.1,827,920 ක ප්‍රදානයක් මෙම දෙපාර්තමේන්තුව වෙත එවා ඇත. එකී මුදල් උපයෝජනය කිරීමෙන් අනතුරුව තවදුරටත් ශේෂව පැවති රු.1,759,670 ක මුදල නව තැන්පතු ගිණුමකට මාරුකරන ලදී. තවද, ව්‍යාපෘති කාලය අවසන්ව ඇති බව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද පරිසර අමාත්‍යාංශය විසින් වාර්තාකර තිබූ අතර එම අමාත්‍යාංශයේ හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඉල්ලීම මත විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ද සලකා බලමින් විදේශ ප්‍රදාන ගිවිසුම් ප්‍රකාරව රු.1,759,670.00ක මුදල ආපසු යැවීම පමණක් මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකර ඇත. | ප්‍රදායකයන්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාළ අරමුණුවලට යෙදවීම පිළිබඳ සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කිරීම. |
| (ඈ) | විදේශාධාර ව්‍යාපෘතිවලින් ලැබී තිබුණු නමුත් උපයෝජනය නොකළ රු.39,794,102 ක ප්‍රදාන තැන්පත් ගිණුම්වල රඳවා ගෙන තිබුණි. එම ව්‍යාපෘති නිම කර වර්ෂ දෙකකට වැඩි කාලයක් ඉකුත් වී තිබුණත්, මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර එසේ රඳවා ගෙන තිබුණු ප්‍රදාන රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. | විදේශාධාර ප්‍රදාන යටතේ රු.39,794,102.38 ක් පමණක් වර්ෂය අවසාන වන විට මු.රෙ. 571 ප්‍රකාරව රජයේ ආදායමට බැර කර ඇත. තවද, ව්‍යාපෘතිය අවසාන වූ දින සිට වර්ෂ 2ක කාලයක් තුළදී ප්‍රදානකරු විසින් හිමිකම් නොපාන ලද එම තැන්පත් ඉකුත් වූ තැන්පතු ලෙස සලකනු ලබන බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු විසින් ලබාදෙන ලද නිර්දේශය ද මත පමණක් මු.රෙ. ප්‍රකාරව ඉහත සඳහන් මුදල රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. | ප්‍රදායකයන්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදන අදාළ අරමුණුවලට යෙදවීම පිළිබඳ සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කළ යුතු වීම. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් 3 ක ශේෂ එකතුව රු.5,468,579 ක් වී තිබුණි. එම තැන්පත් ගිණුම් විදේශ ප්‍රදාන ලැබීම්වලට අදාළ | 2022 වර්ෂය අවසන් වන විට ද අදාළ මුදල් භාවිතා කිරීමට ක්‍රියා නොකරන්නේ නම් අදාළ අමාත්‍යාංශයේ නිර්දේශ මත එම මුදල් රජයේ ආදායමට මාරු | ප්‍රදායකයන්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාළ අරමුණුවලට යෙදවීම |

| | | |
|---|---|---|
| වන අතර එකී ශේෂ වර්ෂ ගණනාවක් මුළුල්ලේ අක්‍රීයව පැවතුණි. එම ප්‍රදාන අදාළ අරමුණට යෙදවීමට කටයුතු කළ යුතු වුවද, එසේ කළ නොහැකි නම් එය මුදල් රෙගුලාසි ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>මෙම මුදල්ද 2022 වර්ෂයේදී භාවිතා කිරීමට නොහැකි වුවහොත් මෙම වර්ෂය අවසානයේදී අදාළ අමාත්‍යාංශය සහ ආයතනයේ නිර්දේශ මත රජයේ ආදායමට බැර කිරීම සඳහා කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | පිළිබඳ සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කිරීම. |

### 3.1.4 මුදල් ප්‍රවාහ කළමනාකරණය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ණය ගැනීමේ වැඩසටහන අනුව සැලසුම්ගත භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු.මිලියන1,235,000 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර බැඳුම්කර වශයෙන් රු.මිලියන 1,742,938 ක් ලබා ගෙන තිබුණි. ඒ අනුව සැලසුම්ගත ඉලක්කය රු.මිලියන 507,938 කින් හෙවත් සියයට 41 කින් ඉක්මවා බැඳුම්කර ලබා ගෙන තිබුණි. | පාර්ලිමේන්තුව මගින් අනුමත කරන ලද අනුමත ණය ගැනීමේ සීමාව තුළ දෙපාර්තමේන්තුව කටයුතු කර ඇති අතර, එම සීමාව තුළ වු එක් එක් ණය ගැනීමේ උපකරණවල වර්ෂය ආරම්භයේදී සැලසුම් කළ සීමාවන් වල උච්චාවචනයන් සිදුවී ඇත. මෙයට මූලිකවම හේතු වී ඇත්තේ සමස්ථ ආර්ථික අවපාතයන් මත ශ්‍රී ලංකාව ණය ශ්‍රේණිගත කිරීම් අනුව පහතට වැටීම හේතුකොට ගෙන විදේශ ණය ගැනීම් සීමාවීම මත අයවැය හිගය පියවීම සඳහා දේශීය වෙළඳපල වෙත යොමු වී භාණ්ඩාගාර බැඳුම්කර වැඩි වශයෙන් නිකුත්කිරීමට සිදුවීමයි. | විධිමත් ලෙස සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතු වීම. |

### 3.1.5 අක් මුදල් නිදහස් කිරීම

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා පුනරාවර්තන හා මූලධන වියදම වශයෙන් පිළිවෙලින් රු.මිලියන 2,694,152 ක් හා රු.මිලියන 1,095,019 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,789,171 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් අනුමත කර | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත භාණ්ඩාගාරය විසින් මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා අක් මුදල් නිදහස් කිරීමේදී පහත කරුණු කෙරෙහි අවධානය | පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා අක්මුදල් නිදහස් කිරීම විධිමත් කළ යුතු වීම. |

තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන හා මූලධන වියදම් වශයෙන් පිළිවෙලින් රු.මිලියන 2,757,343 ක් හා රු.මිලියන 789,636 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,546,979 ක් වැය කර තිබුණි.

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 185 ක් රාජ්‍ය ආයතන 103 ක් විශ්වවිද්‍යාල 38 ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා පළාත් සභා 34 ක් වශයෙන් එකතුව ආයතන 360 කට අදාළව පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.මිලියන1,737,080 ක් ද, මූලධන වියදම් වෙනුවෙන් රු.මිලියන 717,599 ක් ද, වශයෙන් එකතුව රු.මිලියන2,454,679 ක අක්මුදල් සීමාවන් තීරණය කර තිබුණි. අදාළ ආයතන පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.මිලියන1,929,136 ක් ද, මූලධන වියදම් වෙනුවෙන් රු.මිලියන 982,069 ක් ද, වශයෙන් එකතුව රු.මිලියන 2,911,205 ක අක් මුදල් ඉල්ලුම් කර තිබුණි. කෙසේ වුවද, භාණ්ඩාගාරය විසින් එසේ ඉල්ලුම් කළ අක් මුදල් සම්පූර්ණයෙන්ම නිකුත් නොකර අවම අක් මුදල් සීමාවටද වඩා අඩුවෙන්, එනම් පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.මිලියන1,657,642 ක්ද, මූලධන වියදම් වෙනුවෙන් රු.මිලියන 410,891 ක් ද, වශයෙන් එකතුව රු.මිලියන 2,068,533 ක අක් මුදල්, අදාළ ආයතන වෙත නිදහස් කර තිබුණි. ඒ අනුව පුනරාවර්තන වියදම් වෙනුවෙන් ආයතන විසින් ඉල්ලුම් කළ අග්‍රිමයෙන් රු.මිලියන 271,494 ක හෙවත් සියයට 14 ක් ද, මූලධන වියදම් වෙනුවෙන් ආයතන විසින් ඉල්ලුම් කළ අක්මුදල් වටිනාකමින් රු.මිලියන 571,178 ක් හෙවත් සියයට 58 ක් ද, වශයෙන් එකතුව රු.මිලියන 842,672 ක අක් මුදල් භාණ්ඩාගාරය විසින් නිදහස් කර නොතිබුණි.

සමාලෝචිත වර්ෂයේදී ආයතන 360 කට අදාළව ඉල්ලුම් කළ අක් මුදල් වටිනාකම හා නිදහස් කළ අක් මුදල් යොමු කෙරේ.

- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දෛනිකව/මාසිකව කරන ලද අක්මුදල් ඉල්ලීම
- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවට අයත් නිල බැංකු ගිණුම් වල පවතින දෛනික බැංකු/මුදල් ශේෂයන්
- ඒකාබද්ධ අරමුදල යටතේ පවතින මුදල් තත්ත්වයන්
- ඉහළ කළමණාකාරීත්වයේ උපදෙස් පරිදි ජාතික අවශ්‍යතාවයන් මත පදනම්ව ලබාදිය යුතු ප්‍රමුඛතාවයන්
- රාජ්‍ය ණය සේවාකරණය,වැටුප් හා වේතන, විශ්‍රාම වැටුප්, සමෘද්ධි සහනාධාර ආදී අත්‍යවශ්‍ය ගෙවීම් සඳහා ප්‍රමුඛතාවය ලබාදීම
- දේශිය මූල්‍ය වෙළඳපල තුළින් රාජ්‍ය ණය ලබා ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී එහි පවතින ද්‍රවශීලතා තත්වයන් හා මූල්‍ය පිරිවැය පිළිබඳ සාධකයන් ඍජුවම භාණ්ඩාගාර මුදල් ප්‍රවාහය කෙරෙහි බලපෑම් කිරීම
- එසේම 2021කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රාජ්‍ය ආදායමට ඇති වූ ප්‍රමාණාත්මක බලපෑම. ඒ අනුව 2021 වාර්ෂික විසර්ජන පනත යටතේ භාණ්ඩාගාරය විසින් අක්මුදල් නිදහස් කිරීමේදී ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් ආර්ථිකමය වශයෙන් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස අක්මුදල් නිදහස් කිරීමට කටයුතු කර ඇත.

වටිනාකම සැසඳීමේදී ඉල්ලුම් කළ අක් මුදල් වටිනාකමට සාපේක්ෂව පුනරාවර්තන වියදම් ලෙස සියයට 86 ක් ද, මූලධන වියදම් ලෙස සියයට 42 ක් ද වශයෙන් අක්මුදල් නිදහස් කර තිබුණද, වාර්ෂික ඇස්තමේන්තු මගින් අනුමත ප්‍රතිපාදන අනුව රු.මිලියන 345,555 ක් හෙවත් සියයට 14 ක් නිදහස් කර නොතිබුණි.

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 20 ක් පැවති අතර ඉන් පුරප්පාඩු 08 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. | 2021.12.31 දිනට දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 20 ක් පවතින අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08 ක් පවතී. 2021.07.02 දින කාර්යමණ්ඩල පුරප්පාඩු සඳහා නිලධාරීන් ලබාදෙන ලෙස ලිඛිතව ඉල්ලීම් අදාල පාර්ශවයන් වෙත යොමු කර ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීමට අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමටත්, අනවශ්‍ය තනතුරු වේ නම් ඒවා සංශෝධනය කර ගැනීමටත් කටයුතු කළ යුතු වීම. |